සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2018
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

(i) පළමුවන ප්‍රශ්නයට හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(ii) පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10යි.

---

(01) (1) බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සමාජයීය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ මූලිකව සඳහන් වන ග්‍රන්ථ දෙක නම් කරන්න.

(2) ද්විතීය පාවුලු සංදේශ දෙක නම් කරන්න.

(3) ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදා ගැනීම සඳහා පාරාවෝ රජු වෙත යැවූ පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.

(4) ආපෝස්තුලුවරුන් දොළොස් දෙනා අතරින් පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා හඳුන්වන නම් දෙකක් ලියන්න.

(5) පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනු කොටස් දෙක ලියන්න.

(6) කතෝලික සභාවේ ඉගැන්වීම් අනුව පෞද්ගලික දේපළ පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳ දෙවි සමිදාණන් අපට ලබාදුන් දේව පනත් දෙක ලියන්න.

(7) ඊශ්‍රායෙලයේ පූජා වර්ග බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(8) ශුද්ධ වූ ලූක්තුමා රචනා කළ ග්‍රන්ථ දෙක ලියන්න.

(9) ජන වන්දනාව සඳහා දිව්‍ය පූජා පවත්වන විට දම් වර්ණය භාවිතා කරන කාල වකවානු දෙක නම් කරන්න.

(10) ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ මුනිතුමා භාග්‍යවරයට හා ශුද්ධවරයට එස වූ ශුද්ධෝත්තම පියතුමන්ලා දෙදෙනා නම් කරන්න.

(02) (1) දේව අනාවරණයේ ප්‍රධාන මූලාශ්‍ර දෙක නම් කරන්න.

(2) පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණයට අනුව වීරාවලිය, ධර්මදේශකයා, විලාප ගී පොත් අයත් පොත් කාණ්ඩ වෙන වෙන ම නම් කරන්න.

(3) අන්‍යයන්ට දේව වචනය හඳුන්වා දෙන්නට මීසම තුළ දී ඔබට කළ හැකි ක්‍රියා මාර්ග පහක් ලියා විස්තර කරන්න.

(03) (1) ජේසුස් වහන්සේ මහා බ්‍රහස්පතින්දා දින ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.

(2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු තුනක් උදාහරණ සහිතව ලියා දක්වන්න.

(3) ඔබට අන් අය වෙනුවෙන් යාග (පරිත්‍යාගී) විය හැකි අවස්ථා පහක් ලියා විස්තර කරන්න.

(04) (1) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(2) පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත ඇරඹෙන්නේ පඬුරු පෙරහැරෙනි. පඬුරු පිදීමේ පරමාර්ථ තුන ලියන්න.

(3) දිව්‍ය පූජා පිළිවෙතේ අවසාන කොටස වන ධර්ම දූත කාර්යය සඳහා අප පිටත් ව යන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ පණිවිඩය ලෝකය තුළ ක්‍රියාවට නැංවීමට ය. ඒ සඳහා ඔබට කළ හැකි ක්‍රියා මාර්ග 05ක් ලියා විස්තර කරන්න.

(05) (1) ශුද්ධ වූ පාවුලු සමඟ පළමු ධර්ම දූත ගමනට සහභාගි වූ දෙදෙනා නම් කරන්න.

(2) ශුද්ධ වූ පාවුලුතුමා සංදේශ ලියා යැවීමට හේතු වූ කරුණු තුනක් ලියන්න.

(3) ශුද්ධ වූ පාවුලුතුමා රෝම අධිකරණය පුරා කිතු දහම ව්‍යාප්ත කලාක් මෙන් අද ශ්‍රී ලංකාව තුළ කිතු දහම ව්‍යාප්ත කිරීමට ඔබට කළ හැකි මාර්ග පහක් ලියා විස්තර කරන්න.

(06) (1) බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න.

(2) පළමු දේව පනතට විරුද්ධව ක්‍රියා තුනක් නම් කරන්න.

(3) පළමු දේව පනත කඩ කරන ඔබේ මිතුරෙකුට / මිතුරියකට ඔබ දෙන අවවාද පහක් ලියා විස්තර කරන්න.

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.

(1) චතාරික සමය

(2) පේදුරුතුමාගේ මහා ප්‍රකාශනය

(3) රහස් රැකීමේ අවශ්‍යතාවය

(4) ගරු මයිකල් රුද්‍රිගු පියතුමා